සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2017

## Second Term Test - Grade 9 - 2017

**නම :** ................................................ **නාට්‍ය හා රංග කලාව** **කාලය : පැය 02 යි.**

## I කොටස

- I කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- II කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

**පහත දැක්වෙන ගද්‍ය කාණ්ඩ ඇසුරින් 1 - 5 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(A) ''ඔයා කිව්වෙ නියම ගාන තමයි. මේ බලන්න මිල කොටල තියනව. මම කිව්වනෙ සැරයක් ගණන් දෙකක් නැතෙයි කියලා.''

(B) ඇයි මතක නැද්ද? එදා කැලේ දර කඩන්න ආපු වෙලාවෙ. දුවට කිව්වා.

(C) මේ ඉන්නෙ මුදලිතුමයි මායි (සිනහවෙන්) එතකොට අපි සේරම මේකෙ ඉන්නවා. හෝ.... මේක මූණ බලන කණ්ණාඩියක් නොවැ මුදලිතුමෝ.

(D) ''ආච් අම්මා උඩ ගිහින් තියෙන තරම. කියාපන්කො. තාත්තට කිරිගරුඬෙන් මාළිගාවක් හදල දෙන්ඩ කියල.''

(E) මාගේ ශිෂ්‍යා වූ බරණැස් රජුගේ පුත්‍රයා වන මනමේ කුමාරයා සියලු ශිල්ප ශාස්ත්‍රයන්හි පර ප්‍රාප්ත වූ බැවින් ඕ හට ධනුද්ධර යන නාමය ප්‍රදානය කොට සුබ ගමන් පතා සිය රටට යැවිය යුතු ය.

(1) ඉහත සඳහන් සංවාද අතුරින් ''කදා වළලු නාට්‍යයට අයත් සංවාද ඛණ්ඩය ඇතුළත් වන්නේ,

(i) B හි (ii) A හි
(iii) C හි (iv) D හි

(2) ලෝක ධර්මී නාට්‍යයකින් උපුටුගත් සංවාද ඛණ්ඩය වන්නේ,

(i) A හි (ii) B හි
(iii) D හි (iv) E හි

(3) ඉහත ගද්‍ය ඛණ්ඩ අතරින් එදිරිවීර සරත්චන්ද්‍ර මහතාගේ නිර්මාණ වන්නේ,

(i) A, E ය. (ii) A, C ය.
(iii) B, E ය. (iv) A, B ය.

(4) ජාතක කතා ඇසුරින් කළ නාට්‍ය දෙකකින් උපුටා ගත් ගද්‍ය ඛණ්ඩ වන්නේ,

(i) A, B (ii) A, D
(iii) A, E (iv) C, E

(5) C ගද්‍ය ඛණ්ඩය උපුටාගත් නාට්‍ය වන්නේ,

(i) මනමේ (ii) සක්කාය දිට්ඨි
(iii) නරිබෑනා (iv) කැලණි පාලම

। වරහන් තුළ දී ඇති වචන තෝරා හිස්තැන් පුරවන්න.

(ශිථිලකරණ, සතත, සමාරෝපය, තලිය, ආනුෂාංගික, සාත්වික, ආහාර්ය, මාලය)

(6) තම පෞද්ගලික චරිතය අතහැර වෙනත් චරිතයකට ප්‍රවේශ වීම ................................ ලෙස හඳුන්වයි.


(7) ................................ කදා වළලු නාට්‍යයේ එන රංග උපකරණයකි.

(8) අංග රචනය, රංග වස්ත්‍ර වේදිකා ආලෝකකරණය.......................... අංග යටතට ගැනේ.

(9) මුහුණේ උපාංග චලනයෙන් අදහස් ප්‍රකාශ කිරීම ............................................ අභිනය ලෙස හඳුන්වයි.

(10) නිරන්තරයෙන් කරන අභ්‍යාස .......................................... අභ්‍යාස ලෙස හඳුන්වයි.

। පහත දැක්වෙන ඡායාරූප ඇසුරෙන් අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A  B 

(11) මෙහි A රූපයෙන් දැක්වෙන නාට්‍යකරු වන්නේ,

(i) හෙන්රි ජයසේන ය. (ii) බන්දුල ජයවර්ධන ය.
(iii) ගුණසේන ගලප්පත්ති ය. (iv) එදිරිවීර සරත්චන්ද්‍ර ය.
(v) සුගතපාල ද සිල්වා ය.

(12) A රූපයෙන් දැක්වෙන නාට්‍යකරුගේ නිර්මාණයක් වන්නේ,

(i) මරාසාද් (ii) හැංගි හොර
(iii) ආනන්ද ජවනිකා (iv) ඉබි කට්ට
(v) මුහුදු පුත්තු

(13) මෙහි B රූපයෙන් දැක්වෙන නාට්‍යකරු වන්නේ,

(i) ධර්මසිරි බණ්ඩාරනායක ය. (ii) ජයලත් මනෝරත්නය.
(iii) එස් මෞනගුරුය. (iv) කේ. කණපති පිල්ලේය.
(v) සුගතපාල ද සිල්වා ය.

(14) B රූපයෙන් දැක්වෙන නාට්‍යකරුගේ නිර්මාණයක් වන්නේ,

(i) නන්දි විසාල (ii) සුබ සහ යස
(iii) ඉබි කට්ට (iv) තල මල පිපිලා
(v) සුදුරෙදි හොරු

(15) B නාට්‍යකරුගේ ස්වතන්ත්‍ර නාට්‍යක් වන්නේ,

(i) පුත්‍ර සමාගම (ii) හුණුවටයේ කතාව
(iii) රෝමය ගිනි ගනී (iv) දුන්න දුනු ගමුවේ
(v) කපුවා කපෝති

ı 16 සිට 20 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුරු තෝරන්න.

(16) යම්කිසි පුද්ගලයකුගේ චර්යාවන් ඒ ආකාරයෙන් ම වෙනත් අයෙක් කරයි නම් එය

(i) සමාරෝපයයි. (ii) අනුකරණයයි.

(iii) රූපණයයි. (iv) අභිරූපණයයි.

(17) ශරීර අවයවයන්ගේ නම්‍යශීලී බව ඇති කර ගැනීම සඳහා යොදා ගන්නා අභ්‍යාස හඳුන්වනු ලබන්නේ,

(i) ස්වසන අභ්‍යාස නමිනි. (ii) ශිථිලකරණ අභ්‍යාස නමිනි.

(iii) කායික අභ්‍යාස නමිනි. (iv) මානසික අභ්‍යාස නමිනි.

(18) අධික තණ්හාව නිසා පාඩු සිදුවන බව තේමාව කොටගත් නාට්‍යයක් වන්නේ,

(i) මනමේ (ii) නරිබෑනා (iii) කදා වළලු (iv) හවදූත

(19) පෙරලුන ඔරුව හැරවීම

(i) රංග අභ්‍යාසයකි. (ii) රංග ක්‍රීඩාවකි.

(iii) නමනිය අභ්‍යාසයකි. (iv) ශිථිලකරණ අභ්‍යාසයකි.

(20) ළමා නාට්‍යයක් නැරඹීම තුළින් ඔබ තුළින් වර්ධනය නොවන කුසලතාවක් වන්නේ,

(i) ඉවසීම (ii) සාමූහිකත්වය

(iii) පෞරුෂ වර්ධනය (iv) ආත්මාර්තකාමීත්වය

මුළු ලකුණු (2 x 20 = 40)

## II කොටස

g පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

g එක ප්‍රශ්නයකට ලකුණු 10 බැගිනි.

ı පහත දැක්වෙන සංවාද ඛණ්ඩය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සිටු දුව : වළලු බලන්න නෙවේ මම ආවේ. ඔය සිංදුව ඇහිලයි. වළලු කොහොම වෙතත් සිංදුව නම් ලස්සනයි.

සේරි : ඇයි සිටු දුව එහෙම කියන්නේ. සිංදුව කන්දීගෙන සිටිය වගේම මේ වළලුත් බලන්කෝ .

සිටු දුව : ඒක පුදුම කතාවක්නේ. මොකද එහෙම වෙන්න හේතුව?

සේරිවානිජ : ඇයි මේ තරම් ලස්සන සිංදු කියන කෙනෙක් ගාව තියෙන වළලුත් ඒ වගේම ලස්සනයි කියල හිතන්න බැරිද.

සිටු දුව : (සීනාසී) ඔය පුරසාරම් දොඩන මිනිස්සු මට විශ්වාස කරන්න බෑ. (පැත්තක බලා) මට වළලු ඕනි නෑ.

(01) (i) මෙම සංවාද ඛණ්ඩය රංගනය සඳහා නළු නිළියන් කී දෙනෙක් අවශ්‍ය වේ ද? (ලකුණු 2)

(ii) මෙම සංවාදය අදාළ රංග ශෛලිය කුමක් ද? (ලකුණු 2)

(iii) සිටු දුව නිවසින් එළියට පැමිණියේ කුමක් සඳහා ද? (ලකුණු 2)

(iv) මෙහි පළමු වරහන තුළ ඇති අවස්ථාව නිරූපණයට උචිත අභිනය නම් කරන්න. (ලකුණු 2)

(v) ''පුරසාරම්'' යන්නට සමාන පදයක් ලියන්න. (ලකුණු 2)

(02) සාර්ථක රංගන ශිල්පියෙකු බිහි කිරීමට රංග අභ්‍යාස හා රංග ක්‍රීඩා බෙහෙවින් උපකාරී වෙයි.

(i) රංග ක්‍රීඩා හා රංග අභ්‍යාස යනු කුමක් දැයි කෙටියෙන් පහදන්න. (ලකුණු 3)

(ii) ඔබ දන්නා රංග අභ්‍යාස හා රංග ක්‍රීඩා දෙක බැගින් නම් කරන්න. (ලකුණු 2)

(iii) ඒ අතරින් ඔබ කැමති රංග ක්‍රීඩාවක් කරන අයුරු විස්තර කරන්න. (ලකුණු 5)

(03) වේදිකා නාට්‍යයක අදහස් ප්‍රකාශනය සඳහා පසුතල නිර්මාණ බෙහෙවින් ඉහවල් වේ.

(i) වේදිකා පසුතල නිර්මාණ අයත් වන්නේ කුමන අභිනයට ද? (ලකුණු 2)

(ii) වේදිකා පසුතල භාවිතා කරන හා නොකරන නාට්‍ය දෙක බැගින් ලියන්න. (ලකුණු 2)

(iii) වේදිකා පසුතල නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවා දැයි විස්තර කරන්න. (ලකුණු 6)

(04) පහත සඳහන් සිද්ධිය පාදක කරගෙන නාට්‍යයකට සුදුසු පෙළ රචනයක් ලියන්න.

ශූර ගොවියෙකු වූ පොඩි ගමරාළ දිනක් උදෑසන හේනට යන විට තමා සිට වූ වැලක් ඉතා ශක්තිමත් ව වැඩී අහස දක්වා අනන්තය තෙක් විහිදී තිබෙනු දක්නට ලැබිණි. පුදුමයට හේතු වූ මේ කාරණය අසල හේනේ වූ සිරිපාලට පවසා ඔහු කැටුව මෑ වැළ ළඟට පැමිණි පසු .......

(i) නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය (ලකුණු 3)

(ii) සංවාද හා රංග විධාන සහිතව පෙළ නිර්මාණය කිරීම (ලකුණු 3)

(iii) ආදර්ශමත් නිමාව (ලකුණු 4)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2017

## Second Term Test - Grade 9 - 2017

## නාට්‍ය හා රංග කලාව - පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | |
|---|---|---|---|
| (1) - (ii) | (6) - සමාරෝපය | (11) - (iii) | (16) - (ii) |
| (2) - (iii) | (7) - තලිය | (12) - (v) | (17) - (ii) |
| (3) - (i) | (8) - ආනුෂාංගික | (13) - (v) | (18) - (iii) |
| (4) - (iii) | (9) - සාත්වික | (14) - (iii) | (19) - (ii) |
| (5) - (ii) | (10) - සතත | (15) - (iv) | (20) - (iv) |

(ලකුණු 2 x 20 = 40)

### II කොටස

(01) (i) 2 (ලකුණු 2)

(ii) ලෝකධර්මී රංග ශෛලිය (ලකුණු 2)

(iii) සේරිවානිජගේ සිංදුව ඇසීමෙන් (ලකුණු 2)

(iv) සාත්වික අභිනය (ලකුණු 2)

(v) පුරාජේරු, කයිවාරු (ලකුණු 2)

(02) (i) රංගන ශිල්පියෙකු විසින් පුහුණුවීම් සඳහා කරනු ලබන අභ්‍යාස රංග අභ්‍යාසයි. (ලකුණු 3)

(ii) රංග අභ්‍යාස

(i) ශිථිලකරණ අභ්‍යාස (ii) හඬ අභ්‍යාස

(iii) කථන අභ්‍යාස

රංග ක්‍රීඩා

(i) පෙරලුනු ඔරුව (ii) රාක්ෂයෙක් ගමට ඇවිල්ලා

(iii) ගස් දෙකේ ක්‍රීඩාව (iv) ග්‍රෙබියෙල් ඇවිල්ලා (ලකුණු 2)

(iii) එක් ක්‍රීඩාවක් කරන අයුරු විස්තර කර ඇත්නම් (ලකුණු 5)

(03) (i) ආහාර්ය අභිනයට (ලකුණු 2)

(ii) පසුතල භාවිතා කරන - නරිබෑනා, තලමල පිපිලා, කැලණි පාලම

පසුතල භාවිතා නොකරන - සිංහ බාහු, මනමේ (ලකුණු 2)

(iii) නිවැරදිව විස්තර කර ඇත්නම් ලකුණු දෙන්න. (ලකුණු 6)

(04) (i) නාට්‍යෝචිත අවස්ථා නිර්මාණයට (ලකුණු 3)

(ii) සංවාද හා රංග විධාන සහිත පෙළ නිර්මාණයට (ලකුණු 3)

(iii) ආදර්ශවත් නිමාව (ලකුණු 4)